# ඇස් යට කළුවෙලාද ?

අද සමාජයේ බොහෝ දෙනා මුහුණ දෙන ගැටළුවක් වන්නේ තම අලංකාරය නිසි සේ පවත්වාගන්නේ කෙසේද යන්නයි.ඒ සඳහා ඇස් යට කළුවීම මහත් හිසරදයක් වී අවසන්. ඒයට හේතුව ඔබ දන්නවාද ?.

එදිනෙදා ජීවිතයේදී ඔබගේ කාර්යබහුලත්වයත් සමග අධික ලෙස ඇස් වෙහෙසවන බව ඔබ දන්නවාද.එසේ අධික ලෙස ඇස් වෙහෙසවන විට ඔබ නොදැනුවත්වම ඇස් යට කළුවන බව නොරහසක්.ඒ සඳහා නිවසේදීම කල හැකි සරළ ඉතා සාර්ථක ප්‍රතිකාරයක් අද වේදමිණ තුලින් ඔබට.

මුලින්ම පහත සඳහන් ඖෂධ විශ්වාස අන්දමින් සපයා ගන්න.

**සුදුහඳුන් කුඩු කලං 04 - (20g)**

**වැල්මී කුඩු කලං 04**

**වියළි හාතාවාරිය කුඩු කලං 03**

**වෙනිවැල්ගැට කුඩු කලං 03**

ඉහත සඳහන් ඖෂධ ගෙන පිරිසිදු භාජනයකට දමා හොදින් මිශ්‍ර කරගන්න.පසුව ඔබට අවශ්‍ය ප්‍රමාණයක් මිශ්‍රණය ගෙන නැවුම් එළකිරි හෝ යෝගට් සමඟ මදක් ඝනකම් ආලේපයක් ලෙස සකස් කරගෙන ඇස් යට කළුවී ඇති ප්‍රදේශයේ ආලේප කර එය වියළෙන තෙක් තබා පිරිසිදු සිසිල් ජලයෙන් සෝදාහරින්න.මෙය දිනපතා සති 2 පමණ කාලයක් සිදුකිරීම තුලින් සාර්ථක ප්‍රතිපල ලගාකරගත හැක

**"ආලේපනය ඇස් ඇතුළට නොයන සේ ආලේප කිරීමට කල්පනාකාරීවන්න.උෂ්ණාධික ආහාර භාවිතය සීමා කිරීම තුලින් ප්‍රතිපල වඩාත් සාර්ථක කරගත හැක"**